91 වන කාණ්ඩය
4 වන කලාපය

සිකුරාද
1970 ඔක්තෝබර් 23

පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශය [තී. 285]

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 287]

පළමුවන වර කියවන ලද පනත් කෙටුම්පත් [තී. 300] :

විසර්ජන පනත් කෙටුම්පත (1970-71)

වතු නිවාස (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත

ලංකා ගුවන් විදුලි ප්‍රචාරක නීතිගත සංස්ථා රෙගුලාසි [තී. 302]

කල් තැබීමේ යෝජනාව [තී. 314]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 91
இல. 4

வெள்ளிக்கிழமை
23 ஒக்ரோபர் 1970

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி [ப. 285]

வினாக்களுக்கு வாய்மூலவிடைகள் [ப. 287]

முதன்முறை மதிப்பிடப்பட்ட மசோதாக்கள் [ப. 300] :

ஒதுக்கீட்டு மசோதா (1970-71)

தோட்டக்குடிமனைகள் (சிறப்பேற்பாடுகள்) மசோதா

இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனப் பிரமாணங்கள் [ப. 302]

ஒத்திவைப்புப் பிரேரணை [ப. 314]

Volume 91
No. 4

Friday
23rd October 1970

PARLIAMENTARY DEBATES

(HANSARD)

HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

MESSAGE FROM THE GOVERNOR-GENERAL [Col. 285]

ORAL ANSWERS TO QUESTIONS [Col. 287]

BILLS READ THE FIRST TIME [Col. 300] :

Appropriation Bill (1970-71)
Estates Quarters (Special Provisions) Bill

CEYLON BROADCASTING CORPORATION REGULATIONS [Col. 302]

ADJOURNMENT MOTION [Col. 314]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

பிரதிநிதிகள் சபை

House of Representatives

1970 ඔක්තෝබර් 23 වන සිකුරාදා

வெள்ளிக்கிழமை, 23 ஒக்ரோபர் 1970

Friday, 23rd October 1970

අ. භා. 2ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු ස්ටැන්ලි තිලකරත්න] මූලාසනාරූඪ විය.

சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ ஸ்ரன்லி திலகரத்ன] தலைமை தாங்கினார்கள்.

The House met at 2 P.M., MR. SPEAKER [THE HON. STANLEY TILLEKERATNE] *in the Chair.*

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලත් සන්දේශය

மகா தேசாதிபதியிடமிருந்து வந்த செய்தி

MESSAGE FROM THE GOVERNOR-GENERAL

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

අග්‍රාණ්ඩුකාරතුමාගෙන් ලැබී ඇති සන්දේශයක් දැන් මා කියවනවා:

"අග්‍රාණ්ඩුකාර කාර්යාලය,
රජ මැදුර,
මහනුවර,
ශ්‍රී ලංකාව.
1970 ඔක්තෝබර් 20

මහත් මයාණෙනි,

1946 යේ ලංකා (ආණ්ඩුක්‍රම) රාජාඥාවේ 36 (2) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආකාරයට නම් කරන ලද ව්‍යවස්ථා කෙටුම්පතට මහා රාජිණීන් වහන්සේගේ ශ්‍රී නාමයෙන් මම අද දින අනුඥාව දුන් බව ගෞරව පූර්වකව ඔබට දන්වමි:—

'An Act to secure authorized representatives of trade unions the right to enter estates for the purpose of visiting members of such unions or of holding or addressing meetings of such members.'

මෙයට,
ඔබගේ කීකරු සේවක,
ඩබ්ලිව්. ගොපල්ලව,
අග්‍රාණ්ඩුකාර.

නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ
ගරු කථානායකතුමා."

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලත් සන්දේශය

மூதவையிலிருந்து வந்த செய்தி

MESSAGE FROM THE SENATE

කථානායකතුමා

(சபாநாயகர் அவர்கள்)

(Mr. Speaker)

සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් ලැබුණු සන්දේශයක් දැන් ලේකම් විසින් කියවනවා ඇති.

පහත දැක්වෙන සන්දේශය ලේකම් විසින් කියවන ලදී.

செயலதிகாரி பின்வரும் செய்தியை வாசித்தார்:

The Clerk read the following Message:

"මතු පළ වන කෙටුම්පත් පනතට සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය සංශෝධන නොමැතිව එකඟ වී ඇත:

Trade Union Representatives (Entry into Estates)."

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

PAPERS PRESENTED

1967-68 සඳහා වරාය (නැව්බඩු) සංයුක්ත මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.—[නැව් සංයුතු හා සංචාරක කටයුතු ඇමති වෙනුවට ගරු කේ. බී. රත්නායක]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

1970-71 මුදල් වර්ෂය සඳහා වූ ලංකාණ්ඩුවේ අයවැය ඇස්තමේන්තු.—[ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා]

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.

Ordered to lie upon the Table.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
පළමුවන ප්‍රශ්නය.

ගරු ටී. බී. සුබසිංහ (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති)
(கௌரவ ரீ. பி. சுபசிங்ஹ—கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)
(The Hon. T. B. Subasinghe—Minister of Industries and Scientific Affairs)
මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් පමණ කල් ඉල්ලනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගාල්ලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය
காலி நீர் வழங்கும் திட்டம்
GALLE WATER SUPPLY SCHEME

2. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක** (ගාල්ල)
(கலாநிதி டபிள்யு. தஹநாயக்க—காலி)
(Dr. W. Dahanayake—Galle)
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1969 මැයි 19 වන දින පළාත් පාලන අමාත්‍යාංශය විසින් ගාල්ලේ ජල සම්පාදන යෝජනා ක්‍රමය ගැන පුවත් පත් නිවේදනයක් නිකුත් කරන ලද බවත්, වෙනත් කරුණු අතර පහත සඳහන් කරුණු ද එම නිවේදනයේ සඳහන් වූ බවත් එතුමා දන්නවාද?

"රජය විසින් මෙම යෝජනා ක්‍රමයට ඉහළ ම ප්‍රමුඛත්වය දී ඇත. මේ යෝජනා ක්‍රමයේ පළමු කොටසේ වැඩ සඳහා ටැන්ඩර මේ මාසයේ අවසානයේ දී කැඳවනු ඇත. 1971 මුල් කාලයේ දී එම වැඩ අවසන් වනු ඇතැ යි අපේක්ෂා කෙරේ......ගාල්ලේ මහ නගර සභාව මෙම යෝජනා ක්‍රමය පිළිගනිමින්, වැය වන මුදල වෙනුවෙන් එම නගර සභාව විසින් ගෙවිය යුතු වන කොටස ගෙවීමට පොරොන්දු වන අතර, දැනට හියාරේ ඇති ජලය ලබා ගන්නා තැනත්, අනික් ජලය ලබා ගන්නා තැනුත් ඒකාබද්ධ කිරීමෙන් වියදම් අඩු කළ හැකි දැයි සොයා බැලිය යුතු යැයි එම මහ නගර සභාව විසින් 1968.4.9 දින දරන ලිපියෙන් ඉල්ලීමක් කරන ලදී......මේ අනුව රු. එක් කෝටි අසූපන් ලක්ෂයක ඇස්තමේන්තුවක් පදනම් කර ගෙන ප්‍රතිශෝධිත යෝජනා ක්‍රමයක් සකස් කරන ලදී......" (ආ) ටැන්ඩර කැඳවන ලද්දේද? එසේ නම් එයින් ඇති වූ ප්‍රතිඵලය කුමක් ද? (ඉ) දැනට පිළිගෙන ඇති යෝජනා ක්‍රමය කුමක් ද? (ඊ) පළමු වන කොටස අවසන් වූ විට සැපයිය හැකි ජල ප්‍රමාණය කොපමණද? මුළු යෝජනා ක්‍රමය අවසන් වූ විට සැපයිය හැකි වන ජල ප්‍රමාණය කොපමණද? (උ) පළමු වන කොටසේ වැඩ සම්පූර්ණ කර ගැනීමට බලාපොරොත්තු වන්නේ කවදාද? (ඌ) මුළු යෝජනා ක්‍රමය ම පටන් ගෙන අවසන් කිරීමට බලාපොරොත්තු වන්නේ කවදාද?

பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா: (அ) 1969, மே மாதம் 19 ஆந் தேதியன்று உள்ளூராட்சி அமைச்சினால் காலி நீர்வழங்கும் திட்டம் சம்பந்தமாக ஒரு பத்திரிகைச் செய்தி விடுக்கப்பட்டதென்பதையும், மற்றும் விடயங்களுக்கிடையில் பின்வருமாறு அவ் வறிக்கையில் குறிப்பிடப்பட்டிருந்த தென்பதையும் அவர் அறிவாரா: "அரசாங்கத்தினால் இத்திட்டத்திற்கு மிக மேலான முன்னிடம் கொடுக்கப்பட்டுள்ளது. இத்திட்டத்தின் முதலாம் கட்டடவேலைக்காக கேள்வு ஒப்பந்தப்பத்திரங்கள் இம்மாத இறுதியில் கோரப்படும். 1971 ஆரம்ப காலத்தில் அவ் வேலை பூர்த்தியடையுமென எதிர்பார்க்கப்படுகிறது......காலி மாநகரசபை இத்திட்டத்தை ஏற்று, செலவாகும் தொகைக்காக அம்மாநகர சபையினால் கொடுக்கப்பட வேண்டிய தொகையை வழங்க உறுதியளிக்கும் நோக்கிலேயே, தற்பொழுது ஹியாரேயில் நீர் பெறும் இடத்தையும், மற்றும் நீர் பெறும் இடங்களையும் ஒன்றிணைப்பதன் மூலம் செலவைக் குறைக்க முடியுமாவெனக் கேட்டு மாநகரசபையினால் 9.4.1968 இல் ஒரு கடிதம் அனுப்பப்பட்டது. இதற்கிணங்க ஒருகோடி எண்பத்தைந்து இலட்ச ரூபாவுக்கான உத்

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

தேச மதிப்பீட்டை அடிப்படையாகக் கொண்ட திருத்த திட்டமொன்று தயாரிக்கப் பட்டது." ? (ஆ) கேள்வு ஒப்பந்தங்கள் கோரப்பட்டனவா ? ஆமெனில் விளைவு யாது ? (இ) தற்பொழுது ஏற்றுக்கொள்ளப்பட்ட திட்டம் யாது ? (ஈ) முதலாம் கட்டம் பூர்த்தி யடைந்ததும் வழங்கப்படக்கூடிய நீரின் அளவு யாது ? முழுத்திட்டமும் பூர்த்தியடைந் ததும் வழங்கப்படக்கூடிய நீரின் அளவு யாது ? (உ) முதலாம் கட்ட வேலை எப் பொழுது பூர்த்திசெய்யப்படலாமென எதிர் பார்க்கப்படுகிறது ? (ஊ) முழுத்திட்டத்தை யும் ஆரம்பித்து எப்பொழுது பூர்த்தி செய்யப் படுமென எதிர்பார்க்கப்படுகிறது ?

asked the Minister of Public Administration, Local Government and Home Affairs: (*a*) Is he aware that the Minister of Local Government issued a press release on the Galle Water Supply Scheme on 19th May 1969 which stated *inter alia* as follows: "The Scheme has been accorded the highest priority by this Government. The tenders for the first phase of work will be called at the end of this month. It is anticipated that this work will be completed in early 1971. ..... The Galle Municipal Council while accepting this scheme and undertaking to pay the Council's share of the cost, requested the Ministry of Local Government to consider the possibility of reducing costs by the incorporation of the existing Hiyare source and other sources by their letter dated 9.4.1968..... A revised scheme at an estimated cost of Rs. 18.5 million was accordingly drawn up"? (*b*) Have tenders been called? If so, with what result? (*c*) What is the scheme that has been accepted? (*d*) What will be the capacity of the first phase of work, and of the entire scheme when completed? (*e*) When is it anticipated to complete the first phase of work? (*f*) When is it anticipated to take up and complete the entire scheme?

ගරු කේ. බී. රත්නායක (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමති) (රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති වෙනුවට)

(கௌரவ கே. பி. ரத்நாயக்க—பாராளு மன்ற அலுவல்கள், விளையாட்டுக்கள் அமைச் சர்—பொது நிர்வாகம், உள்ளூராட்சி, உள் நாட்டு அலுவல்கள் அமைச்சர் சார்பாக)

(The Hon. K. B. Ratnayake—Minister of Parliamentary Affairs & Sports—on behalf of the Minister of Public Administration, Local Government and Home Affairs)

(අ) එසේය. (ආ) එසේය. යෝජනා ක්‍රමයේ I වන අවස්ථාව සඳහා ටෙන්ඩර්පත් කැඳවන ලද නමුත්, ටෙන්ඩර්පත් කැඳවන ලද්දේ කැබිනට් මණ්ඩලයේ අනුමතිය ට යටත්ව බැවින් කවර ටෙන්ඩරයක් හෝ තෝරා නොගන්නා ලදී. මෙම ව්‍යාපාරය සඳහා අවශ්‍ය විදේශ විනිමය විදේශ ආධාරවලින් සෙවිය යුතුයයි 1969. 11. 4 දින පවත්වන ලද කැබිනට් මණ්ඩලයේදී නියම කරන ලදී. මෙම නියමයේ හේතුවෙන් I වන අවස්ථාවේ වැඩ ආරම්භ නො කරන ලදී. (ඉ) ගිං ගඟෙන් ජලය පොම්ප කිරීමෙන් දැනට පවත්නා හියාරේ ජල සම්පාදන යෝජනා ක්‍රමය වර්ධනය කිරීම. (ඊ) යෝජනා ක්‍රමයේ I වන අවස්ථාව වනුයේ හියාරේ යෝජනා ක්‍රමයෙන් ජලය ලබාගෙන බෙදා හැරීම සඳහා නගරයේ ගැලුම් විසිලක්ෂයෙක ධාරිතාවයක් ඇති ජලාසයක් තැනීමය. යෝජනා ක්‍රමයේ II වන අවස්ථාවට පිළියම් කර්මාන්ත තැනීම, සම්ප්‍රේෂන් නලමාර්ග යෙදීම හා මුළු මහ නගර සභා ප්‍රදේශයම ආවරණය වනසේ ජලය බෙදාහැරීමේ ක්‍රම යෙදීම ඇතුළත් වන්නේ ය. (උ) I වන අවස්ථාවේ වැඩ ආරම්භ කිරීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. (ඌ) කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබුනාට පසු වැඩ ආරම්භ කිරීම අපේක්ෂා කෙරේ. ඉන් අනතුරුව හැකිතාක් ඉක්මනින් වැඩ අව සන් කරනු ලැබේ.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක

(கலாநிதி டபிள்யு. தஹநாயக்க)

(Dr. W. Dahanayake)

පටන්ගන්නා දිනය දන්නවාද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු කේ. බී. රත්නායක
(கௌரவ கே. பி. ரத்நாயக்க)
(The Hon. K. B. Ratnayake)

පිළිතුරේනම් එය නැහැ. පසුව දන්වන්නම්.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Question No. 4.

ගරු ආචාර්ය බදියුද්දීන් මහ්මූද් (අධ්‍යාපන ඇමති)
(கௌரவ கலாநிதி பதியுத்தீன் மஹ்மூத்—கல்வி அமைச்சர்)
(The Hon. Dr. Badiuddin Mahmud—Minister of Education)

I want one week's time to answer this Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

Question ordered to stand down.

ගාල්ලේ ආරෝග්‍යශාලාවේ කම්කරුව සිටි එන්. එච්. එඩ්වින් මහතා : පාරිතෝෂික මුදල් හා විශ්‍රාම වැටුප්

திரு. என். எச். எட்வின், இளைப்பாறிய தொழிலாளர், காலி ஆசுப்பத்திரி : பணிக்கொடையும் உபகாரச்சம்பளமும்

MR. N. H. EDWIN, RETIRED LABOURER, GALLE HOSPITAL : GRATUITY AND PENSION

5. ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : අවුරුදු 18 ක සේවයට පසුව, ගාල්ලේ ආරෝග්‍ය ශාලාවේ කම්කරු තනතුරින් මීට අවුරුදු දෙකකට වැඩි කාලයකට පෙර විශ්‍රාම ලැබූ, ගාල්ලේ, හිරිඹුරේ, බදුවත්තේ 532/2 දරන ස්ථානයෙහි පදිංචි එන්. එච්. එඩ්වින් මහතාට ලැබිය යුතු පාරිතෝෂික මුදල සහ විශ්‍රාම වැටුප වහාම ගෙවීමට එතුමා නියෝග කරන්නේද ?

பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா: 18 வருட சேவையின் பின்னர், இரண்டு வருடங்களுக்கு மேற்பட்ட காலத்திற்கு முன்னால் காலி ஆசுப்பத்திரியில் தொழிலாளர் பதவியிலிருந்து ஓய்வு பெற்றவரும் காலி, கிரிம்புறே, பட்டுவத்தை 532/2 ஆம் இலக்கத்தைச் சேர்ந்தவருமான திரு. என். எச். எட்வின் என்பவருக்குக் கொடுக்க வேண்டிய உபகாரச் சம்பளத்தையும் பணிக்கொடையையும் உடனே கொடுக்குமாறு பணிப்பாரா ?

asked the Minister of Public Administration, Local Government and Home Affairs : Will he order the immediate payment of the gratuity and pension due to Mr. N. H. Edwin of 532/2, Baduwatte, Hirimbure, Galle, who retired from the post of labourer in the Galle Hospital over 2 years ago after 18 years of service ?

ගරු කේ. බී. රත්නායක (රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති වෙනුවට)
(கௌரவ கே. பி. ரத்நாயக்க—பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சர் சார்பாக)
(The Hon. K. B. Ratnayake—on behalf of the Minister of Public Administration, Local Government and Home Affairs)

The pension of Mr. N. H. Edwin of 532/2, Baduwatte, Hirimbure, Galle, has been awarded by Director of Pension's letter No. PN (O) 72004/P of 14.9.70. The G. A., Galle, and S. H. S., Galle, have been instructed regarding the payment.

උපාධිධාරී ගුරුවරුන් පත් කිරීම

பட்டதாரி ஆசிரியர் தெரிவு

RECRUITMENT OF GRADUATE TEACHERS

7. එස්. කතිරවේලුපිල්ලෙ මයා. (කෝපායි)
(திரு. எஸ். கதிரவேலுப்பிள்ளை—கோப்பாய்)
(Mr. S. Kathiravelupillai—Kopai)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) පහත සඳහන් වර්ගවල උපාධිධාරී ගුරුවරුන් සම්බන්ධයෙන් ඇති බඳවා ගැනීමේ පරිපාටිය කුමක්ද ? (i) සිංහල මාධ්‍යය—සිංහල උපාධිධාරීන් ; (ii) සිංහල මාධ්‍යය—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුස්ලිම් උපාධිධාරීන් ; (iii) දෙමළ මාධ්‍යය—දෙමළ උපාධිධාරීන් ; (iv) දෙමළ මාධ්‍යය—මුස්ලිම් උපාධිධාරීන් ? (ආ) ඉහත සඳහන් එක් එක් වර්ගය යටතේ බඳවා ගැනීමට යෝජනා කර ඇති ගුරුවරුන් මුළු ගණන කොපමණ ද? (ඉ) මෙම ගුරුවරුන් තෝරා ගැනීමේ පදනම කුමක් ද? (ඊ) තෝරා ගැනීම් කැරෙන්නේ, බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව හුදෙක් කුසලතාව මත බවට එතුමා ප්‍රතිඥාවක් දෙන්නේ ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா : (அ) பின் வரும் வகுதிகளில் பட்டதாரி ஆசிரியர்களை நியமிக்கும் திட்டம் என்ன : (i) சிங்கள மொழி—சிங்கள பட்டதாரிகள், (ii) சிங்கள மொழி—முஸ்லிம் பட்டதாரிகள், (iii) தமிழ் மொழி—தமிழ் பட்டதாரிகள், (iv) தமிழ் மொழி—முஸ்லிம் பட்டதாரிகள் ? (ஆ) மேற் கூறிய வகுதிகள் ஒவ்வொன்றிற்கும் நியமிக் கப்படவிருக்கும் மொத்தத் தொகை என்ன ? (இ) தெரிவு முறை யாது ? (ஈ) நியமன திட் டத்திற்கமைய சிறப்புத் திறமையின் படியே தெரிவு நடைபெறும் என்று உறுதியளிப் பாரா ?

asked the Minister of Education : (*a*) What is the scheme of recruitment of graduate teachers of the following categories : (i) Sinhala medium—Sinhalese graduates ; (ii) Sinhala medium—Muslim graduates ; (iii) Tamil medium—Tamil graduates ; (iv) Tamil medium—Muslim graduates ? (*b*) What is the total number proposed to be recruited to each of the above categories ? (*c*) What is the basis of selection ? (*d*) Will he give an assurance that the selection would be exclusively on merit subject to the scheme of recruitment ?

ගරු ආචාර්ය බදියුද්දීන් මහ්මූද්
(கௌரவ கலாநிதி பதியுத்தீன் மஹ்மூத்)
(The Hon. Dr. Badiuddin Mahmud)

(*a*) Graduate teachers are recruited on a general scheme of recruitment approved by the Public Service Commission, which is common to all categories. (*b*) The total number proposed to be appointed is 2,500. It is not possible to give the total number at this stage under each category as selections are still in the process of finalization. (*c*) Selections will be made on the basis of the needs of the schools and subject-combinations of the applicants. (*d*) Does not arise in view of (*c*).

කතිරවේලුපිල්ලෙ මයා.
(திரு. கதிரவேலுப்பிள்ளை)
(Mr. Kathiravelupillai)

Are lists being supplied by Members of Parliament or others for the purpose of selection ?

ගරු ආචාර්ය බදියුද්දීන් මහ්මූද්
(கௌரவ கலாநிதி பதியுத்தீன் மஹ்மூத்)
(The Hon. Dr. Badiuddin Mahmud)

I have received all kinds of lists from all kinds of people, not only from Members of Parliament—from unions, graduate associations, various bodies, Members of Parliament, Senators, members of the public—

කතිරවේලුපිල්ලෙ මයා.
(திரு. கதிரவேலுப்பிள்ளை)
(Mr. Kathiravelupillai)

Are those lists being taken into consideration in the matter of appointments ?

ගරු ආචාර්ය බදියුද්දීන් මහ්මූද්
(கௌரவ கலாநிதி பதியுத்தீன் மஹ்மூத்)
(The Hon. Dr. Badiuddin Mahmud)

As far as possible we shall take them into consideration.

වී. ඒ. සුගතදාස මයා., (උතුරු කොළඹ)
(திரு. வீ. ஏ. சுகததாச—கொழும்பு வடக்கு)
(Mr. V. A. Sugathadasa—Colombo North)

Has the Hon. Minister of Education written specifically to all Members of Parliament ?

ගරු ආචාර්ය බදියුද්දීන් මහ්මූද්
(கௌரவ கலாநிதி பதியுத்தீன் மஹ்மூத்)
(The Hon. Dr. Badiuddin Mahmud)

I have not written to anybody.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Question No. 8.

ගරු ආචාර්ය බදිඋද්දීන් මහ්මූද්
(கௌரவ கலாநிதி பதியுத்தீன் மஹ்மூத்)
(The Hon. Dr. Badiuddin Mahmud)

I need time to answer that Question because I have to collect more information.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

Question ordered to stand down.

ගං.නි.ස.ම. කම්කරුව සිටි පී. ජී. නන්දියස් සිල්වා මහතාට ලැබිය යුතු මුදල්

திரு. பி. ஜீ. நந்தியாஸ் சில்வா, இளைப்பாறிய தொழிலாளர், ஆ.ப.அ.ச.: வருமதிப் பணம்

MR. P. G. NANDIAS SILVA, RETIRED LABOURER, R. V. D. B. : MONEYS DUE

9. **ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

කම්කරු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගාල්ලේ, මාගාල්ලේ වැල්ලබොඩ 9/9 දරන ස්ථානයෙහි පදිංචි පී. ජී. නන්දියස් සිල්වා මහතා තමා කම්කරුවකු වශයෙන් (අංකය T.T.D 7/893) සේවය කළ ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයෙන් ලැබිය යුතු (i) අර්ථ සාධක අරමුදලේ මුදල් හා (ii) හදිසි අනතුරක් සම්බන්ධයෙන් වන්දි මුදල් ලබා ගැනීම සඳහා ලියුම් ගණනාවක්ම යවා ඇතත්, ඔහුට නිසි පිළිතුරක් ලැබී නැති බව එතුමා දන්නේද? (ආ) තවදුරටත් ප්‍රමාදයක් නැතිව ඔහුට ලැබිය යුතු සියළු මුදල් ගෙවන බවට එතුමා වග බලා ගන්නේද?

தொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) ஆற்றுப் பள்ளத்தாக்கு அபிவிருத்திச் சபையின் கீழ் தொழிலாளராகக் கடமையாற்றிய வரும் (இல. T. T. D. 7/893) காலி, மாகாலி, வல்லபொத்த 9/9 இலக்கத்தைச் சேர்ந்தவருமான திரு. பி. ஜீ. நந்தியாஸ் சில்வா என்பவருக்குச் சேரவேண்டிய தொகைகளை, அதாவது (i) சகாய நிதியையும் (ii) ஓர் விபத்து சம்பந்தமான நட்ட ஈட்டையும் கொடுக்குமாறு அவர் பல கடிதங்கள் எழுதியும் சரியான பதில் இல்லையென்பதை அறிவாரா? (ஆ) கொடுக்கவேண்டிய தொகைகளை மேலுந் தாமதமின்றிக் கொடுக்கச் செய்வாரா?

asked the Minister of Labour : (*a*) Is he aware that Mr. P. G. Nandias Silva of 9/9, Wellaboda, Magalle, Galle, has written numerous letters to obtain his dues, namely, (i) provident fund dues, and (ii) compensation in respect of an accident from the R. V. D. B., where he served as a labourer, No. T.T. D7/893, but that he has not been sent a proper reply ? (*b*) Will he see that all dues are paid without further delay ?

හේමචන්ද්‍ර සිරිසේන මයා. (කම්කරු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)
(திரு. ஹேமச்சந்திர சிறிசேன—தொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. Hemachandra Sirisena—Parliamentary Secretary to the Minister of Labour)

(අ) නැත. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ අර්ථසාධක අරමුදල කම්කරු කොමසාරිස් විසින් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතෙහි 27 (1) වන වගන්තිය යටතේ අනුමත කරන ලද පෞද්ගලික අරමුදලකි. ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ සේවකයන්ගේ අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් පැන නගින කරුණු ගැන ක්‍රියා කරනුයේ එම මණ්ඩලයයි. වන්දි මුදල් ගෙවීමත් එම මණ්ඩලයට අයත් කාර්යයකි. (ආ) නන්දියස් සිල්වා මහතාට ගෙවිය යුතු යම් මුදලක් වේනම් එය ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය සතු කාර්යයකි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අක්කරපත්තු දකුණ ගම්සභාව : ආදර්ශ ප්‍රජා මණ්ඩලයක් සඳහා දුන් මුදල

அக்கரைப்பற்று தெற்கு கி. ச.: மாதிரி சன சமூக நிலையத்திற்கு ஒதுக்கப்பட்ட பணம்

AKKARAIPATTU SOUTH V. C.: MONEY ALLOCATED FOR MODEL COMMUNITY CENTRE

3. **එම්. එම්. මුස්තාපා මයා.** (නින්තවූර්) (එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා.—පොතුවිල්—වෙනුවට)

(ஜனாப் எம். எம். முஸ்தபா—நிந்தவூர்—ஜனாப் எம். ஏ. அப்துல் மஜீது—பொத்துவில்—சார்பாக)

(Mr. M. M. Mustapha—Nintavur—on behalf of Mr. M. A. Abdul Majeed—Pottuvil)

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්ව දේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) ආදර්ශ ප්‍රජා මණ්ඩලයක් ගොඩ නැංවීම සඳහා අක්කරපත්තුව දකුණ ගම් සභාවට රු. 7,500 ක් වෙන් කර දෙන ලද බවත්; (ii) මෙම ප්‍රජා මණ්ඩලය ගොඩ නැංවීම පිණිස ඉහත කී ගම් සභාවට අව සර දෙන ලද බවත්, කරන ලද වියදම් සම් බන්ධයෙන් චෙක් රෝල් හා වෙනත් අවශ්‍ය ලියකියවිලි තබා ගන්නා අන්දම පිළිබඳව පැහැදිලි උපදෙස් 69.12.28 දින දී සභාපතිවරයාට දෙන ලද බවත්; (iii) මෙම වැඩය කිරීමේදී සභාපතිවරයා මෙම උපදෙස් සහ ගම්සභා නීතිරීති ගැන නො සළකා ක්‍රියා කළ බවත්; (iv) මෙම වැඩය සඳහා වෙන් කර ඇති ආධාර මුදල සභා පතිවරයා විසින් ලබා ගෙන ඇතත් ප්‍රජා මණ්ඩලය තවමත් සම්පූර්ණ කර නැති බවත්; (v) සභාපතිවරයා මුදල ලබාගෙන ඇත්තේ කාර්මික නිළධාරියාගේ සහතික යක් නැතිව බවත් එතුමා දන්නේද? (ආ) මෙම අක්‍රමිකතා සම්බන්ධයෙන් එතුමා පරීක්ෂණයක් පවත්වන්නේද?

பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) மாதிரி சனசமூக நிலையம் ஒன்று நிறுவும் பொருட்டு அக்கரைப்பற்று தெற்கு கிராமச் சங்கத்திற்கு ரூபா 7,500 ஒதுக்கி கொடுக்கப்பட்ட தென்பதையும்; (ii) இச் சனசமூக நிலையத்தை நிறுவ மேற்கூறிய சன சமூக நிலையத்திற்கு அனுமதி வழங்கப்பட்ட தென்பதையும் செய்த செலவுகள் சம்பந்த மாக பெயரிடாப்பு வைக்கும் முறைபற்றியும் மற்றும் தேவையான கடிதக் கோவைகளை வைக்கும் முறைபற்றியும் மிகத் தெளிவான ஆலோசனைகள் 69.12.28 ஆம் தேதி தலைவ ருக்கு அளிக்கப்பட்டனவென்பதையும்; (iii) இவ் வேலைகளைச் செய்யும்போது தலைவர் இவ் வாலோசனைகளையும் கிராமச் சங்க சட்ட திட் டங்களையும் பொருட்படுத்தாது நடந்து கொண்டுள்ளார் என்பதையும்; (iv) இவ் வேலைகளுக்காக ஒதுக்கப்பட்ட உதவிப் பணத்தைத் தலைவர் பெற்றுக் கொண்டுள்ளா ரெனினும் சனசமூக நிலைய வேலைகள் இன் னும் பூர்த்தியாகவில்லை என்பதையும்; (v) தலைவர் பணத்தை பெற்றுக் கொண்டது தொழில்நுட்ப உத்தியோகத்தரின் சான்றி தழ் இன்றி என்பதையும் அவர் அறிவாரா? (ஆ) இத் தகாச் செயல்கள் சம்பந்தமாக அவர் ஒரு விசாரணையை நடத்துவாரா?

asked the Minister of Public Administration, Local Government and Home Affairs; (*a*) Is he aware that (i) a sum of Rs. 7,500 was allocated to the Akkaraipattu South V. C. for the construction of a model community centre; (ii) the V. C. was allowed to construct this centre and clear instructions were given to the chairman on 28.12.69 as to how check rolls and other necessary documents should be maintained for the expenses incurred; (iii) the chairman ignored these instructions and the V. C. rules in the execution of this work; (iv) the chairman has drawn the grant allocated for this work but that the centre is still not complete; (v) the chairman has drawn the money without a certificate from the technical officer? (*b*) Will he inquire into these irregularities?

ගරු ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක (රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති)

(கௌரவ பீலிக்ஸ் ஆர். டீ. பண்டார நாயக்க—பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சர்)

(The Hon. Felix R. D. Bandaranaike—Minister of Public Administration, Local Government and Home Affairs)

(*a*) (i) Yes. (ii) Yes. (iii) Not yet known. This is being looked into. (iv) Yes. (v) Yes. (*b*) Yes. This has already been done and the explanation of the chairman has been called for.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කලවානේ කොස්වත්ත ගාමිනී මහා විද්‍යාලය : ක්‍රීඩා භූමිය

கொஸ்வத்தை காமனி மகா வித்தியாலயம் கலவான : விளையாட்டு மைதானம்

KOSWATTE GAMINI MAHA VIDYALAYA, KALAWANA : PLAYGROUND

6. **තිස්ස ආර්. බලල්ල මයා.** (යාපහුව) (සරත් මුත්තෙට්ටුවේගම මයා.—කලවාන—වෙනුවට)

(திரு. திஸ்ஸ ஆர். பலல்ல—யாபஹுவ—திரு. சரத் முத்தெட்டுவெகம—கலவான—சார்பாக)

(Mr. Tissa R. Balalle—Yapahuwa—on behalf of Mr. Sarath Muttetuwegama—Kalawana)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) කලවානේ කොස්වත්ත ගාමිනී මහා විද්‍යාලයේ ක්‍රීඩා භූමියක් තැනීම සඳහා කොපමණ මුදලක් වියදම් කර තිබේද? (ආ) මේ මුදල් ගෙවන ලද්දේ කාටද? (ඉ) මෙම ක්‍රීඩා භූමිය තැනීමේ කටයුතු අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියකු විසින් අධීක්ෂණය කරන ලද්දේද? (ඊ) එසේ නම් ඒ නිලධාරියා කවුද? (උ) මෙම ක්‍රීඩා භූමියේ දැන් තත්ත්වය පිළිබඳව එතුමා වාර්තාවක් ලබා ගන්නේද? (ඌ) මේ සම්බන්ධයෙන් කිසිවෙකුට නොනිසි ලෙස ගෙවා ඇති මුදල් ඇත්නම්, ඒවා ආපසු අයකර ගැනීමට එතුමා පියවර ගන්නේද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா : (அ) கலவானயிலுள்ள கொஸ்வத்தை காமினி மகா வித்தியாலய விளையாட்டு மைதான அமைப்பிற்கென எவ்வளவு பணம் செலவு செய்யப்பட்டுள்ளது? (ஆ) பணங்கள் யாருக்குக் கொடுக்கப்பட்டன? (இ) இவ்வேலையை கல்வித்திணைக்கள உத்தியோகத்தர் யாராவது மேற்பார்வை செய்தாரா? (ஈ) அப்படியாயின், அவர் யார்? (உ) இவ் விளையாட்டு மைதானத்தின் தற்போதைய நிலை பற்றி ஓர் அறிக்கை சமர்ப்பிக்குமாறு பணிப்பாரா? (ஊ) இதன் தொடர்பில் முறைகேடாக யாருக்காவது பணம் கொடுக்கப்பட்டிருப்பின் அதை அறவிட நடவடிக்கைகள் எடுப்பாரா?

asked the Minister of Education : (*a*) How much money has been spent on the construction of a playground at the Koswatte Gamini Maha Vidyalaya, Kalawana? (*b*) To whom were the moneys paid? (*c*) Did any officer of the Education Department supervise the construction of this work? (*d*) If so, who was the officer? (*e*) Will he call for a report as to the present condition of this playground? (*f*) Will he take steps to recover any moneys improperly disbursed to any person in this connection?

ගරු ආචාර්ය බදිඋද්දීන් මහ්මුද්

(கௌரவ கலாநிதி பதியுத்தீன் மஹ்மூத்)

(The Hon. Dr. Badiuddin Mahmud)

(*a*) Rs. 14,522.80. (*b*) To the Parent-Teachers' Association. (*c*) Yes. (*d*) 1. Sub-Inspector of School Works, Mr. R. Jayasekera ; 2. Sub-Inspector of School Works, Mr. C. Vivekanandamoorthy ; 3. School Works Overseer, Mr. R. A. Chandrapala. (*e*) Action will be taken to obtain a report. (*f*) No irregular payment has been made to anyone.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

BILLS PRESENTED

විසර්ජන පනත් කෙටුම්පත, 1970-71

ஒதுக்கீட்டு மசோதா, 1970-71

APPROPRIATION BILL, 1970-71

"1970-71 මුදල් වර්ෂය තුළ සේවාවන් සඳහා විධිවිධාන සැලසීමත්, එම සේවාවන් උදෙසා මෙරටින් හෝ පිටරටින් හෝ ණය ලබා ගැනීමට බලය දීමත්, ඒ මුදල් වර්ෂය තුළ රජයේ යම් යම් කටයුතු වෙනුවෙන් මුදල් සැපයීමත්, එම කටයුතු සම්බන්ධයෙන් ඒ මුදල් වර්ෂය තුළ අවශ්‍ය වන මුදල් ලංකාවේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයේ හෝ රජයට සුදුස්සක් කළ හැකි වෙනත් අරමුදලකින් හෝ මුදල්වලින් අත්තිකාරම් වශයෙන් ගෙවීමට ඉඩ සැලසීමත්, එම ඒකාබද්ධ අරමුදලට එවැනි මුදල් ආපසු ගෙවීමට විධිවිධාන සැලසීම සහ යථෝක්ත කරුණු හා සම්බන්ධ වූ හෝ එයට ආනුෂංගික වූ කරුණු සඳහා විධිවිධාන සැලසීමත් සඳහා වූ පනත් කෙටුම්පතකි."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පිළිගන්වන ලද්දේ මුදල් ඇමති ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා විසිනි. 1970 ඔක්තෝබර් 25 වන ඉරිදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

நிதி அமைச்சர் கௌரவ கலாநிதி என். எம். பெரோரா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1970 ஒக்ரோபர் 25, ஞாயிற்றுக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

Presented by the Hon. Dr. N. M. Perera, Minister of Finance ; to be read a Second time upon Sunday, 25th October 1970, and to be printed.

වතු නිවාස (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත

தோட்டக் குடிமனைகள் (சிறப்பேற்பாடுகள்) மசோதா

ESTATES QUARTERS (SPECIAL PROVISIONS) BILL

"වතුවල සේවා යෝජකයන් විසින් එම වතුවල සේවකයන්ට සපයනු ලබන නිවාස සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන පැනවීම පිණිස වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ වැවිලි කර්මාන්ත ඇමති සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා කටයුතු ඇමති ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා විසිනි. 1970 ඔක්තෝබර් 25 වන ඉරිදා දෙවන වර කියවිය යුතු යයිද එය මුද්‍රණය කළ යුතුයැයිද නියෝග කරන ලදී.

தோட்டக் கைத்தொழில், அரசியலமைப்பு அலுவல்கள் அமைச்சர் கௌரவ கலாநிதி கொல்வின் ஆர். த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1970, ஒக்ரோபர் 25, ஞாயிற்றுக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் ஆணையிடப்பட்டது.

Presented by the Hon. Dr. Colvin R. de Silva, Minister of Plantation Industry and Minister of Constitutional Affairs ; to be read a Second time upon Sunday, 25th October 1970, and to be printed.

මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

சபை அமர்வு

SITTINGS OF THE HOUSE

ගරු මෛත්‍රීපාල සේනානායක (වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග ඇමති සහ සභා නායක)

(கௌரவ மைத்திரிபால சேனநாயக்க—நீர்ப்பாசன, மின்சக்தி, பெருவீதிகள் அமைச்சரும் சபை முதல்வரும்)

(The Hon. Maithripala Senanayeke—Minister of Irrigation, Power and Highways and Leader of the House)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"අද දින විසිර යැමේදී මන්ත්‍රී මණ්ඩලය 1970 ඔක්තෝබර් මස 25 වැනි ඉරිදා අ. භා. 2 වන තෙක් කල් තැබිය යුතුය."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Question put, and agreed to.

ලංකා ගුවන් විදුලි ප්‍රචාරක නීතිගත සංස්ථාව (උපදේශක කාරක සභා) රෙගුලාසි

இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபன (ஆலோசனைக் குழுக்கள்) பிரமாணங்கள்

CEYLON BROADCASTING CORPORATION (CONSULTATIVE COMMITTEES) REGULATIONS

ගරු ආර්. එස්. පෙරේරා (ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)

(கௌரவ ஆர். எஸ். பெரோரா—தகவல், ஒலிபரப்பு அமைச்சர்)

(The Hon. R. S. Perera—Minister of Information and Broadcasting)

ගරු කථානායකතුමනි, මා නමින් තිබෙන යෝජනාව ඉදිරිපත් කරනවා. යෝජනාව මෙසේ යි:

"1966 අංක 37 දරණ ලංකා ගුවන් විදුලි ප්‍රචාරක නීතිගත සංස්ථා පනතේ 45(1) වන වගන්තිය යටතේ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති විසින් පනවන ලදුව 1970 අගෝස්තු මස 14 වන දින අංක 14,919 දරණ ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරන ලද්දාවූත්, මෙහි උපලේඛනයෙහි දැක්වෙන්නාවූත් රෙගුලාසි අනුමත කළ යුතුය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

උපලේඛනය

රෙගුලාසි

1. මෙම රෙගුලාසි ලංකා ගුවන් විදුලි සංස්ථාවේ (උපදේශක කාරක සභා) 1970 රෙගුලාසි ලෙස හැඳින් විය යුතුය.

2. (අ) (3) වැනි ඡේදයේ සඳහන් වන ගුවන් විදුලි ප්‍රචාරක කටයුතු සම්බන්ධ සංස්ථාවට උප දෙස් දීම සඳහා සංස්ථාව අවශ්‍ය යයි සළකන උපදේශක සභා වුවමනා ප්‍රමාණයක් සංස්ථාව මගින් සංස්ථාපනය කළ හැකිය.

(ආ) (1) වැනි ඡේදය යටතේ සංස්ථාපනය කරනු ලබන උපදේශක කාරක සභා, මින් පසු මෙම රෙගුලාසිවල "අනුශාසක කාරක සභාව" ලෙස හැඳින් වෙයි.

(ඇ) උපලේඛනයේ සඳහන් විෂයන් ගෙන් එකක් හෝ වැඩි ගණනක් හෝ වරින් වර තීරණය කෙරෙන එවැනි වෙනත් කරුණු හෝ ඇමති වරයාගේ එකඟත් විය ඇතිව සංස්ථාව විසින් එක් එක් අනුකාරක සභාව වෙත පැවරිය යුතුය.

(ඈ) එක් එක් අනුශාසක කාරක සභාවේ සභා පති වශයෙන්, එම අනුශාසක කාරක සභාවේ සාමාජිකයෙකු සංස්ථාව මගින් පත් කළ යුතුය.

(ඉ) යම්කිසි ආගමික කටයුත්තක් සම්බන්ධ යෙන් පත් කෙරෙන අනුශාසක කාරක සභාවක් හැර සෑම අනුශාසක කාරක සභාවක් ම සාමාජික යින් 6 දෙනෙකුට නොවැඩි ගණනකින් සමන්විත විය යුතු අතර ඔවුන් අතරින් හතර දෙනෙකුට නොවැඩි ගණනක් සංස්ථාව මගින් ද, දෙදෙනෙකුට නොවැඩි ගණනක් ඇමතිවරයා විසින් ද පත් කළ යුතුය.

(ඊ) ආගමික කටයුතු සම්බන්ධයෙන් පත් කෙරෙන සෑම උපදේශක කාරක සභාවක් ම සාමාජිකයින් දස දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර, ඉන් හතර දෙනෙකුට නොවැඩි ගණනක් ඇමතිවරයා විසින් ද, හය දෙනෙකුට නොවැඩි ගණනක් සංස්ථාව මගින් ද පත් කළ යුතුය.

(උ) සෑම අනුශාසක සභාවක් ම යටත් පිරිසෙයින් තෙමසකට වරක් වත් රැස් විය යුතු අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන කෙනෙකු රැස්වීම්වලට සහභාගිවී එහි ලේකම්වරයා වශයෙන් කටයුතු කළ යුතුය.

(ඌ) පනත යටතේ වන සියලු බලතල හා කාර්ය නියමයන් ක්‍රියාවට පරිවර්තනය කිරීමේදී ඕනෑම කරුණක් නියමිත අනුශාසක කාරක සභාව වෙත සිය අභිමතය පරිදි උපදෙස් සඳහා ඉදිරිපත් කිරීමට සංස්ථාවට හැකි වන්නේ ය.

3. (අ) ගුවන් විදුලි ප්‍රචාරයට සම්බන්ධ සියලුම කරුණු සම්බන්ධයෙන් පොදුවේ උපදෙස් දීම සඳහා, සංස්ථාවේ සියලුම උපදේශක කාරක සභා සභාපතිවරුන් ගෙන් ද, ඇමතිවරයා විසින් නම් කරනු ලබන තිදෙනෙකුගෙන් ද සමන්විත ප්‍රධාන අනුශාසක කාරක සභාවක් සංස්ථාව විසින් පිහිටුවිය යුතුය.

(ආ) (1) වැනි ඡේදය යටතේ පිහිටුවනු ලබන උපදේශක සභාව මෙම රෙගුලාසිවල හැඳින් වෙන්නේ "ප්‍රධාන අනුශාසක කාරක සභාව" යනුවෙනි.

(ඇ) ඇමතිවරයාගේ අනුමතියද ඇතිව ප්‍රධාන අනුශාසක කාරක සභාවේ සාමාජිකයෙකු එහි සභාපති වශයෙන් සංස්ථාව මගින් පත් කළ යුතුය.

(ඉ) ප්‍රධාන අනුශාසක කාරක සභාව සෑම දෙසතියකටම වරක් රැස් විය යුතු අතර එම රැස්වීම්වලට අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙකු හෝ සහභාගි විය යුතුය. ප්‍රධාන අනුශාසක කාරක සභාවේ ලේකම්වරයා ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරන කෙනෙකු කටයුතු කළ යුතුය.

4. (අ) සංස්ථාව මගින් ප්‍රචාරය කරනු ලබන විවිධ වැඩ සටහන්වල අගය තක්සේරු කිරීමෙහිලා සංස්ථාවට උපකාරී වීම් වස් තමන්ට ප්‍රමාණවත් යයි හැඟී යන උපදේශක කාරක සභා පත් කිරීමට සංස්ථාවට හැකිය. එවැනි කාරක සභාවලට ගුවන් විදුලි අසන්නන් අතුරෙන් සංස්ථාව මගින් තීරණය කරනු ලබන සංඛ්‍යාවක් ද පත් කළ හැකිය.

(ආ) (1) වැනි ඡේදය යටතේ පිහිටුවනු ලබන උපදේශක කාරක සභාව, මෙම රෙගුලාසිවලදී "අසන්නන්ගේ අනුමණ්ඩල" යනුවෙන් හැඳින් වේ.

(ඇ) මෙසේ පිහිටුවන ලද එක් එක් මණ්ඩලයට සභාපති කෙනෙකු හා ලේකම් කෙනෙකු බැගින් සංස්ථාව මගින් පත් කළ යුතුය.

(ඈ) අසන්නන්ගේ අනු මණ්ඩලවල කාර්යයන් හා එම මණ්ඩලවල රැස්වීම්වලදී අනුගමනය කළ යුතු පිළිවෙත් සංස්ථාව විසින් සකස් කළ යුතුය.

5. එක් එක් අනුශාසක කාරක සභාව හෝ අසන්නන්ගේ අනු මණ්ඩල මගින් හෝ ඒ ඒ කාරක සභාවට හෝ අනු මණ්ඩලයට හෝ පැවරී ඇති කරුණු සම්බන්ධයෙන් සංස්ථාවට උපදෙස් දීම යුතුකම වන්නේ ය.

6. (අ) අනුශාසක කාරක සභාවක, අසන්නන්ගේ අනු මණ්ඩලයක හෝ, ප්‍රධාන අනුශාසක කාරක සභාවක, ඇමතිවරයා විසින් පත් කරනු ලැබූ සෑම සාමාජිකයෙකුම, මිය යැමෙන් හෝ, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත්වනු ලැබීමෙන් කලින් සිය ධුරය හිස් නොකළහොත් මිස අවුරුදු තුනක කාලයකට සිය ධුරය දැරිය යුතු අතර, එම තනතුරට නැවත පත් කිරීමට ද සුදුසු වේ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිය රාජකාරි කාලය අවසන් වීමට ප්‍රථම සාමාජිකත්වය අහිමිවුනු කෙනෙකු වෙනුවට පත්වුණු තැනැත්තා, පදවියෙන් අස්කිරීම ඉල්ලා අස්වීම, ඉවත්වීම හෝ මරණය හෝ සිදු නොවී නම්, පසුව පත්වූ අයට කලින් තැනැත්තාට හිමිව තිබුණු සේවා කාලයේ ඉතිරි කොටස අවසන් වනතුරු ඔහු සිය ධූරය දැරිය යුතුය.

(ආ) උපදේශක කාරක සභාවකට අසන්නන්ගේ අනු මණ්ඩලයකට හෝ ප්‍රධාන අනුශාසක කාරක සභාවට පත්කරනු ලබන ඕනෑම සාමාජිකයෙකුගේ සාමාජිකත්වය කිසිම හේතුවක් නොදක්වාම අවලංගු කිරීමට ඇමතිවරයාට හැකි වන්නේ ය.

(ඇ) අනුශාසක කාරක සභාවක සෑම සභාපතිවරයෙකුම, එවැනි කාරක සභාවක සභාපති පදවිය අහෝසි වූ විට ප්‍රධාන අනුශාසක කාරක සභාවේ සාමාජිකත්වය ද අහෝසි වේ.

7. (අ) සියළු අනුශාසක කාරක සභා, අසන්නන්ගේ අනු මණ්ඩල සහ ප්‍රධාන අනුශාසක කාරක සභාවේ තීරණ ගනු ලබන්නේ රැස්වීමට සහභාගි වී සිටින හා ඡන්දය දෙන සාමාජිකයින්ගේ බහුතර ඡන්දයෙනි. එහෙත් ඡන්දය සමව ලැබුණ විටෙක සභාපති හෝ රැස්වීමේ මුලසුන දරණ තැනැත්තා විසින් දෙවන ඡන්දය හෝ තීරණ ඡන්දය පාවිච්චි කළ හැකි ය.

(ආ) රැස්වීමක ගණපූරණය පහත සඳහන් පරිදි විය යුතුය :—

(i) උපදේශක කාරක සභාවක හෝ අසන්නන්ගේ අනුමණ්ඩලයක නම් එම කාරක සභාවේ හෝ අනුමණ්ඩලයේ සාමාජිකයින් තිදෙනෙකි.

(ii) ප්‍රධාන අනුශාසක කාරක සභාවේ සාමාජිකයින් හත් දෙනෙකි.

8. මෙම රෙගුලාසිවල :—

"පනත" යනුවෙන් හැඳින්වෙන්නේ 1966 අංක 37 දරණ ලංකා ගුවන් විදුලි සංස්ථා පනතය.

"සංස්ථාව" යනුවෙන් හැඳින්වෙන්නේ පනත යටතේ සංස්ථාපිත ලංකා ගුවන් විදුලි සංස්ථාවය.

"අධ්‍යක්ෂ ජනරාල්" යනුවෙන් හැඳින්වෙන්නේ පනතේ 19 වැනි වගන්තිය යටතේ පත් කළ අධ්‍යක්ෂ ජනරාල්වරයාය.

"ඇමතිවරයා" යනුවෙන් පනතේ සඳහන් අර්ථයම ගැනේ.

උපලේඛනය

(අ) බෞද්ධ කටයුතු
(ආ) ක්‍රිස්තියානි කටයුතු
(ඇ) හින්දු කටයුතු
(ඈ) මුස්ලිම් කටයුතු
(ඉ) පාඨශාලා අධ්‍යාපනය
(ඊ) වැඩිහිටි අධ්‍යාපනය
(උ) නාටක, කථා, සාකච්ඡා සහ වෙනත් විශේෂාංග ඇතුළු සිංහල වාචික වැඩ සටහන්
(ඌ) නාටක, කථා, සාකච්ඡා සහ වෙනත් විශේෂාංග ඇතුළු ද්‍රවිඩ වාචික වැඩ සටහන්
(එ) නාටක, කථා, සාකච්ඡා සහ වෙනත් විශේෂාංග ඇතුළු ඉංග්‍රීසි වාචික වැඩ සටහන්
(ඒ) සිංහල සංගීතය
(ඔ) ද්‍රවිඩ සංගීතය
(ඕ) ඉංග්‍රීසි සංගීතය
(ක) විද්‍යාව හා කර්මාන්ත සහ වෛද්‍ය විද්‍යාව
(ග) කෘෂිකර්මය සහ ග්‍රාමීය කටයුතු
(ජ) තරුණ පක්ෂය පිළිබඳ කටයුතු
(ට) වනිතාවන්
(ඩ) වෙළඳ සේවය
(ත) වෙළඳ දැන්වීම්
(ත) ලෝක කටයුතු සහ ප්‍රවෘත්ති
(ද) ජාතික එකමුතුව."

මේ යෝජනාව ඉදිරිපත් කරන අතර ඉංග්‍රීසි මුද්‍රණයේ අත් වැරදීමකින් සිදු වී තිබෙන සුළු මුද්‍රණ දෝෂයක් ගැන මා පළමුවෙන්ම කණගාටුව ප්‍රකාශ කරනවා. සිංහල මුද්‍රණයත් ගැසට් පත්‍රයත් හරියාකාරව තිබෙනවා. නමුත් ඉංග්‍රීසි මුද්‍රණයේ අර උපදේශක කාරක සභා විස්සෙන් හතරක් මුද්‍රණය වී නැහැ. ඒ නිසා නැවත වරක් එය මුද්‍රණය කිරීමට මා අණ දුන්නා. ගරු කථානායකතුමනි, එහි ශෝධිත මුද්‍රණය ඇවිත් තිබෙනවා. එය මේ අවස්ථාවේම ඉදිරිපත් කරන්නට මට පුළුවන් වීම ගැන මා සන්තෝෂ වෙනවා.

ගරු කථානායකතුමනි, ලංකා ගුවන් විදුලි ප්‍රචාරක නීතිගත සංස්ථාව පිහිටුවා දැනට අවුරුදු 3ක් පමණ වෙනවා. ඒ සංස්ථා පනතේ 45 වැනි වගන්තිය යටතේ මෙන්න මෙහෙම කියනවා. එය ඉංග්‍රීසියෙන් කියවෙන්නේ මෙහෙමයි :

"45. (1) The Minister may make regulations for the purpose of the establishment of one or more consultative committees to advise the Corporation on such matters relating to broadcasting as may be referred to the committees by the Corporation.

(2) Regulations made under sub-section (1) may prescribe the remuneration payable to the members of the consultative committee or committees."

මේ අනුව සංස්ථා පනතේ 45 (1) වැනි වගන්තිය යටතේ මෙය ඉදිරිපත් කර සම්මත කළ යුතුව තිබුණේ මේ සංස්ථාව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ආර්. එස්. පෙරේරා]

පිහිටුවූ යුගයේදීමයි. එහෙත් මොන හේතුවක් නිසාද මා දන්නේ නැහැ ඒ කාලයේ මෙම අනුශාසක කාරක සභා පත් කර නැහැ. මේ කාරක සභා පත් කළ යුතුය යි ගුවන් විදුලි කොමිෂන් සභා වාර්තාවේත් පැහැදිලිවම කියා තිබෙනවාය කියා මා හිතනවා. එම වාර්තාවේ 50 වැනි පිටුවේ 189 හා 190 ඡේදවලින් එය කියා තිබෙනවා. 192 ඡේදයේ Suggested Scheme යටතේ පැහැදිලිවම කියා තිබෙනවා. මේ අවස්ථාවේ ඒවා විස්තර කළ යුතුයි කියා මා හිතන්නේ නැහැ.

මෙය මේ සංස්ථාව පිහිටු වූ අවස්ථාවේම කළ යුතුව තිබුණු වැඩක්. එය මෙතෙක් කර නැත්තේ අමතකවීමකින්ද කියා මා දන්නේ නැහැ. ඒ නිසා ගුවන් විදුලි නීතිගත සංස්ථා පනතේ 45 වැනි වගන්තිය යටතේ මේ අනුකාරක සභා පත්කිරීමට මා අදහස් කරන්නේ රටේ මහජනයාගේ නොයෙකුත් ජන කොටස්වලට නියම ආකාරයෙන් සේවය කිරීම පිණිසයි. අනු කාරක සභා 20 ක් පත් කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. එම කාරක සභා මෙන්න මේවායි :

"(අ) බෞද්ධ කටයුතු;
(ආ) ක්‍රිස්තියානි කටයුතු;
(ඇ) හින්දු කටයුතු;
(ඈ) මුස්ලිම් කටයුතු;
(ඉ) පාඨශාලා අධ්‍යාපනය;
(ඊ) වැඩිහිටි අධ්‍යාපනය;
(උ) නාටක, කථා, සාකච්ඡා සහ වෙනත් විශේෂාංග ඇතුළු සිංහල වාචික වැඩ සටහන්;
(ඌ) නාටක, කථා, සාකච්ඡා සහ වෙනත් විශේෂාංග ඇතුළු ද්‍රවිඩ වාචික වැඩ සටහන්;
(එ) නාටක, කථා, සාකච්ඡා සහ වෙනත් විශේෂාංග ඇතුළු ඉංග්‍රීසි වාචික වැඩ සටහන්;
(ඒ) සිංහල සංගීතය;
(ඔ) ද්‍රවිඩ සංගීතය;
(ඕ) ඉංග්‍රීසි සංගීතය;
(ක) විද්‍යාව හා කර්මාන්ත සහ වෛද්‍ය විද්‍යාව;
(ග) කෘෂිකර්මය සහ ග්‍රාමීය කටයුතු;
(ජ) තරුණ පක්ෂය පිළිබඳ කටයුතු;
(ට) වනිතාවන්;
(ඩ) වෙළඳ සේවය;
(න) වෙළඳ දැන්වීම්;
(ත) ලෝක කටයුතු සහ ප්‍රවෘත්ති;
(ද) ජාතික එකමුතුව."

මේ උපදේශක කාරක සභා 20 පත් කිරීමට බලාපොරොත්තු වන අතර මේ 20 ට පත් වන ප්‍රධාන සභාපතිවරුන්ගෙන්

සමන්විත ප්‍රධාන අනුශාසක කාරක සභාවකුත් මේ යටතේ පත් කිරීමට බලාපොරොත්තු වෙනවා. මෙයින් බලාපොරොත්තු වන්නේ ගුවන් විදුලි නීතිගත සංස්ථාවෙන් රටේ ජන කොටස් වලට ඒ ඒ ආගම්වලට ඒ ඒ සංගීත අංශවලට යනාදී වශයෙන් මා කලින් සඳහන් කළ ශීර්ෂයන් යටතේ උපරිම සේවයක් ලබා දීම සඳහා ඒ ඒ විෂයයන් පිළිබඳව විශේෂ දැනුමක් ඇති අය ඒවාට පත් කර ඔවුන්ගේ අවවාද අනුශාසනා සහ දැනීම ප්‍රයෝජනයට ගෙන ඒ අනුව ක්‍රියා කිරීමෙන් ගුවන් විදුලි නීතිගත සංස්ථාවෙන් මහජනතාවට උපරිම ප්‍රයෝජනය ලබා දීමටයි. යම් දවසක තවත් උපදේශක සභා පත් කරන්නට අවශ්‍ය වෙතොත් එයටත් මේ යෝජනාව යටතේ ඉඩ සලසා ඇති බව මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමතියි.

ගරු කථානායකතුමනි, දීර්ඝ ලෙස කථා කළ යුතු ප්‍රශ්නයක් මෙහි තිබෙනවා කියා මා හිතන්නේ නැහැ. මා මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ අනුශාසක කාරක සභා හැටියට නම්වන කාරක සභාත් ඒ අනුව ඇති වන ප්‍රධාන අනුශාසක කාරක සභාවත් පත් කිරීමටයි. එය විස්තරාත්මකව දැන් තමුන්නාන්සේලා ඉදිරියේ තබා තිබෙනවා. මෙය අනුමත නොවුණොත් නීත්‍යානුකූලව මේ කාරක සභා පත් කරන්නට බැහැ. ගුවන් විදුලි සංස්ථාවේ පාලක මණ්ඩලයට උපදෙස් දීම පිණිස මෙය නීතිගත වන්නට ඕනෑ, ගුවන් විදුලි සංස්ථා පනතේ 45 වැනි වගන්තිය යටතේ. ඒ නිසා මෙය අනුමත කිරීම පිණිස මා මෙය සභාව ඉදිරියේ තබනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

අ. භා. 2.25

ජේ. ආර්. ජයවර්ධන මයා. (දකුණු කොළඹ පළමුවන)
(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்பு தெற்கு முதலாம் அங்கத்தவர்)
(Mr. J. R. Jayewardene—First Colombo South)

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා කීවා අනුශාසක මණ්ඩල පත් කිරීම ප්‍රමාද වුණා කියා. ගුවන් විදුලි සංස්ථාව ඇති

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලංකා ගුවන් විදුලි ප්‍රචාරක නීතිගත සංස්ථාව (උපදේශක කාරක සභා) රෙගුලාසි

කරන්නට කලින් නම් මෙවැනි අනුශාසක මණ්ඩල තිබුණා. එහෙත් ගුවන් විදුලි සංස්ථාව ඇති වුණාට පසුව පරණ ඒවා අහෝසි වන්නට ඇති.

අහෝසි වීමෙන් පසු අලුතින් පත් කිරීමට ප්‍රමාදයක් ඇති වුණ බව මා පිළිගන්නවා. ඒ නිසා අද ඉදිරිපත් කර තිබෙන මෙම රෙගුලාසි අවශ්‍ය බව වුවමනා බව, මා පිළිගන්නවා.

මා මේ අවස්ථාවේ නැගිට සිටියේ වෙනත් කාරණාවක් ගැන මතක් කරන්නයි. ඔක්තෝබර් මස 4 වෙනි දින රාත්‍රි 9 ටත් 9.15 ටත් අතර ගුවන් විදුලියෙන් එක්තරා ප්‍රවෘත්තියක් ප්‍රකාශ වුණා. එනම්, වෘත්තීය සමිති නායකයින් කිහිප දෙනෙක් ගරු කම්කරු ඇමතිතුමා හමුවීමට ගොස් වෘත්තීය සමිති සේවකයන්ගේ පඩි වැඩි කිරීම ගැන ඇමතිතුමාට මතක් කළා ලු. ඒ අවස්ථාවේදී එම නියෝජිත පිරිස තවත් දෙයක් කියා තිබෙනව ලු. එනම් ප්‍රතිගාමී වෘත්තීය සමිති ඒ පඩි වැඩි කිරීමට අවහිර කරනවාලු. කිසිම වෘත්තීය සමිතියක් සේවකයන්ගේ පඩි වැඩි කිරීම ගැන විරුද්ධ වේය හෝ අවහිර කරාය කියා මා නම් කල්පනා කරන්නේ නැහැ. එහෙම කරාවියයි හිතන්න අමාරුයි. ඒ නිසා රජයට අයත් මහජනයාට අයත් ගුවන් විදුලියෙන් යම්කිසි වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් මෙවැනි ප්‍රවෘත්තියක් ප්‍රකාශ කිරීම වැරදියි. ප්‍රධාන වෘත්තීය සමිති නායකයෙක් මේ ගැන මෙම සංස්ථාවේ සභාපතිතුමාටත් ලියා තිබෙනවා. ඒ නිසා කරුණා කර ඒ ගැන විභාග කර බලන්නය කියා මා මතක් කරනවා. මේ මණ්ඩල මාර්ගයෙන් වත් එවැනි අසත්‍ය ප්‍රවෘත්ති ප්‍රකාශ කිරීම නැවැත්වුවහොත් හොඳ යයි මා කල්පනා කරනවා.

අ. භා. 2.27

ඒ. අසීස් මයා. (පත් කරන ලද මන්ත්‍රී)
(ஜனாப் ஏ. அஸீஸ்—நியமன அங்கத்தவர்)
(Mr. A. Aziz—Appointed Member)

Mr. Speaker, I wish to make certain observations on what the hon. Leader of the Opposition said. It is very necessary. Before I deal with the hon. Leader of the Opposition, with regard to the regulations themselves I wish to suggest that in the Schedule there should be two additions. There should be added a programme on trade union affairs. I would also submit for the consideration of the Hon. Minister that the problems of the plantation workers and various programmes which would be of interest to them should be included in the Schedule.

Then, Sir, I am not surprised that the hon. Leader of the Opposition has put on the cap! According to today's papers, another trade union organization also has put on the cap. I should like the hon. Leader of the Opposition to listen to what I am saying because it concerns him. I do not know why the hon. Leader of the Opposition and another trade union organization that was associated with him and his party in the last Parliament should put on the cap if the cap did not fit them. After all, the radio report said that certain reactionary trade union organizations, so far as my recollection goes, had tried to obstruct the wage increase to plantation workers. Does the hon. Leader of the Opposition mean to say that the reactionary trade unions are entitled to oppose a wage increase, or is it that no trade union has opposed the wage increase?

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

There are no reactionary trade unions!

එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා. (මීගමුව)
(திரு. என். டென்சில் பர்னாந்து—நீர் கொழும்பு)
(Mr. N. Denzil Fernando—Negombo)

If there are reactionary trade unions you must name them.

අසීස් මයා.
(ஜனாப் அஸீஸ்)
(Mr. Aziz)

Mr. Speaker, if you will permit me, I shall relate a short story—[*Interruption*]. I shall be brief.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

As there is not much business on the agenda, you may do so.

අසීස් මයා.
(ஜனாப் அஸீஸ்)
(Mr. Aziz)

Mr. Speaker, once in a cotton store there was a big theft. A large amount of cotton had been stolen. The proprietor of the firm called all those persons who had any connexion with the cotton store to a meeting. At the meeting he said, "I have caught the person who stole the cotton, because he is now having a piece of cotton on his head", and straightaway the thief put his hand on his head to remove the piece of cotton which he thought was on his head.

I put my Friend, the Leader of the Opposition, in that group. Some other organization has protested to the C.B.C., and the "Daily News" carries that protest today, saying that an attack has been made on reactionary trade union organizations. What is wrong in the C.B.C. saying that reactionary trade unions are opposing a wage increase?

I would like to give my hon. Friend, the Leader of the Opposition, a little history on this matter. In February 1970, when my hon. Friend, the Leader of the Opposition, was part of the Government of this country, the appropriate wages board passed a resolution increasing the wage of the rubber estate worker by 30 cents by including the 30 cents in the base figure of the cost of living index. The idea was that as the cost-of-living index went up and down, the wage will vary but the 30 cents will be added to the base figure.

Then a trade union organization, which was an ally of the Government of the time, went behind the back of the wages board. It is necessary that my hon. Friend, the Leader of the Opposition, should know this, that he should know the misdeeds of his own Government. It will be an education for him to know how his Government handled the estate labour with stooges on their side.

The resolution was passed by the wages board and it was gazetted. Then objections were invited. At this stage the Ceylon Estates Employers' Federation got round this trade union organization, which was at that time an ally of the Government of my hon. Friend, the Leader of the Opposition. I suppose that trade union organization is still an ally of the party of the hon. Leader of the Opposition. That trade union organization went by the back-door and entered into an agreement with the Employers' Federation saying that the wage increase should be cor-related to the price of rubber. Just imagine a trade union organization taking up the position that a wage increase should be cor-related to the price of rubber! One could have understood if they took up the position that the increase should be cor-related to some item on the cost-of-living index, like dhal or textiles. With that agreement they came before the wages board and abstained from voting and destroyed the whole thing.

ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.
(திரு. டென்சில் பர்னாந்து)
(Mr. Denzil Fernando)

That may have been more advantageous to the workers.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අසීස් මයා.
(ஜனாப் அஸீஸ்)
(Mr. Aziz)

My hon. Friend should not intervene when he does not know the facts. I shall tell him what has been the advantage. On the basis of that collective agreement today the plantation worker, in place of that 30 cents, is not getting even five cents from the variation in price.

The joke of the story is this. Having done that they tried to get the then Minister of Labour to extend the agreement to the entire country. Luckily the Government fell, and it is good that they fell. Before they could complete the misdeed their Government fell and the new Government came into power, and I am very grateful to the Minister of Labour that he did not extend that bad agreement to the rest of the workers in this country.

Sir, what has happened ? The picture is not yet complete. When progressive trade union organizations jointly brought in a motion to the wages board to increase the wages of the workers in rubber estates by 97 cents, this reactionary organization and an ally of my Friend put before the wages board that 97 cents was not enough and that it should be Rs. 1.35 per day. Having sabotaged the increase of 30 cents, they are now saying that 97 cents is not enough and that they want Rs. 1.35, merely in order to create confusion in the minds of the nominated members as to the real needs and demands of the rubber estate workers.

Sir, after every story there is a tailpiece and the tailpiece is this: that the Employers' Federation with whom these gentlemen have entered into an agreement said this at the wages board, and it is on record ; they said only six months ago, "You entered into an agreement with us saying that when the price of rubber is 86 cents you will ask for only a ten-cent increase. Why is it that today when the price of rubber is 86 cents you are demanding Rs. 1.35 ? What is the justification ? What has happened in the meantime ?" I said that what has happened in the meantime is that the Government has changed and the party which was in power is no longer there.

Sir, this kind of subterfuge in the trade union movement must be stopped. I am glad that the C. B. C.—it was not at our instance—did get this information and mentioned that the reactionary trade union organizations are trying to obstruct the wage increase. If my Friend thought that his conscience has been touched in this matter, it will be a good idea if he advises his own trade union organizations and tells his allies not to resort to these reactionary methods to obstruct the wage increase to the workers.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

"සභාව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

කථානායකතුමනි, කල් තැබීමේ යෝජනාව යටතේ මා ප්‍රශ්නයක් ඇසීමට කල් දී තිබෙනවා.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

කාටද කල් දුන්නේ ?

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

වාරි මාර්ග, විදුලි බල කටයුතු හා මහා මාර්ග ඇමතිතුමාට හෝ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු බාර ඇමතිතුමාට.

ගරු මෛත්‍රීපාල සේනානායක
(கௌரவ மைத்திரிபால சேனநாயக்க)
(The Hon. Maithripala Senanayeke)

මට නම් තවම ලැබුණේ නැ.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

අද පාන් දරම මා එය එව්වා. එන්න ඇති.

ගරු කේ. බී. රත්නායක
(கௌரவ கே. பி. ரத்நாயக்க)
(The Hon. K. B. Ratnayake)

It has been referred to the Ministry. The answer is not ready.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

When will the answer be ready ?

ගරු කේ. බී. රත්නායක
(கௌரவ கே. பி. ரத்நாயக்க)
(The Hon. K. B. Ratnayake)

The day after tomorrow I shall be able to give an answer.

අ. භා. 2.38

ජේ. ආර්. ජයවර්ධන මයා.
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

I also sent notice of two questions. One is for the Hon. Minister of Education. The other is for the Hon. Minister of Housing and Construction. I do not know whether they have received the questions ; otherwise I can ask them later.

One is about the recruitment of graduates. It is in Sinhala, but I shall speak in English. You have advertised in the Government Gazette of August 7, 1970, that preference is given to certain people with certain qualifications. The qualifications are laid down there. But I understand that people without the qualifications are recruited and people with the qualifications are being ignored. There had been a demonstration in front of the Ministry Office and the hon. Parliamentary Secretary to the Minister of Education has looked into this matter. It will be useful if he makes a statement on what principle these graduates are selected and whether they will be given preference over those who are not qualified.

The other matter is about the stoppage of work in the State Engineering Corporation sites. About 4,000 employees are without work owing to a stoppage of work at Narahenpita, Hunupitiya, Maligawatta and Tulhiriya. I do not think one should close a factory because there are labour disputes. Now people are suffering without employment and those in

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

employment should not suffer because there is a lack of discipline among the workers.

අ. භා. 2.40

ගරු ආචාර්ය බදියුද්දීන් මහ්මුද්
(கௌரவ கலாநிதி பதியுத்தீன் மஹ்மூத்)
(The Hon. Dr. Badiuddin Mahmud)

As far as I am aware, we have appointed the type of graduates that we need for our institutions. We have taken in all the Bachelor of Education degree holders. We have taken in almost all the science-qualified Sinhala graduates. We have also taken in a good number of Tamil science-qualified graduates, those who have Geography Honours and History Honours, and those who have qualified in Mathematics and other subjects. There may be in the list others who are not so well qualified. According to the needs of the schools we have recruited them but if you have in mind any deserving cases which have been ignored, and if you bring these cases to my notice, I shall look into them.

අ. භා. 2.41

ගරු පී. ජී. බී. කෙනමන් (නිවාස හා ගොඩනැගිලි ඇමති)
(கௌரவ பீ. ஜீ. பி. கெனமன்—வீடமைப்பு, நிர்மாண அமைச்சர்)
(The Hon. P. G. B. Keuneman—Minister of Housing and Construction)

With regard to the matter referred to by the hon. Leader of the Opposition, I have been compelled to close down temporarily three sites of the State Engineering Corporation, the reason being that there have been a number of incidents of violence taking place particularly at these sites.

These incidents have nothing to do with trade unions though some members of trade unions are involved. It became necessary for me to take action to close down these sites so that I can re-establish normal conditions under which people can work.

It is very interesting to note that these incidents should have been stepped up immediately after I had made certain announcements in this House and the press that I intend to make a radicial reorganization of the work of the State Engineering Corporation.

I am equally intrigued by the fact that the hon. Leader of the Opposition should raise this matter, and in a way I am not surprised because one of the biggest sources of the problem that we have today is about 3,000 to 4,000 casual people who were taken on by most extraordinary means in the few months before the General Election. I have been left with this legacy, and I tried very hard to give them some type of work even though they were recruited by my hon. Friends. I regret to say that it is precisely from among these people that some of these troubles that we are now having are coming.

I am also rather sorry that I have to state that there is evidence to show that one or two of the officials of the organization are also involved in some of these troubles. I can assure my hon. Friend that it became necessary to close down these sites so that I can establish normal working conditions, and as soon as these normal working conditions are established we shall open the sites.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු කෙනමන්]

We had similar trouble at Tulhiriya as my hon. Friend knows. What happened there appeared to be a clear case of sabotage which we all, everybody, condemn. In order to bring that into order I had to close down the work-site, and now that the site is in the process of being reopened and reconditioned, and my hon. Friend is anxious that work should continue normally, he will understand the steps I am taking at this moment.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 2.45ට අද දින සභාසම්මතිය අනුව, 1970 ඔක්තෝබර් මස 25 වන ඉරිදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.

இதன்படி பி. ப. 2.45 க்கு சபை அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 1970 ஒக்ரோபர் 25, ஞாயிற்றுக்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Adjourned accordingly at 2.45 P.M. *until 2* P.M. *on Sunday, 25th October 1970, pursuant to the Resolution of the House this Day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org